වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2025

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

கடன் இணக்க சபைத் திணைக்களம்

DEPARTMENT OF DEBT CONCILIATION BOARD

වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2025

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

கடன் இணக்க சபைத் திணைக்களம்

DEPARTMENT OF DEBT CONCILIATION BOARD

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 231

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

හැඳින්වීම

ඉඩකඩම්, කුඹුරු, වතුපිටි නිවාස වැනි නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණයගැතිවී ඇති මහජනතාව එම ණයගැතිභාවයෙන් මුදවාලීම සඳහා කිසියම් සහනදායි ක්‍රියා මාර්ගයක් හඳුන්වාදීම අරමුණ කරගෙන 1941 අංක 39 දරණ සහනදායක ආඥාපනත යටතේ මෙම දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මීට අමතරව 1999 දී කරන ලද අංක 29 දරණ සංශෝධන පනතට අනුව හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් මණ්ඩලයට මැදිහත් වී සහන සැලැස්වීමට හැකිවීමෙන් මෙම සහනදායී ක්‍රියාමාර්ගය තවත් පුළුල් වී ඇත. මෙම මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මගින් මුදල් හිමියන් විසින් අත්තනෝමතික ලෙස ණය ගැතියන් ගසාකනු ලැබීමට ඇති ඉඩකඩ අසුරනු ලබයි. මණ්ඩලයේ මූලික පරමාර්ථය මෙය වුවද එමඟින් ණයහිමියන්ට ද අසාධාරණයක් සිදුවීමට ඉඩ නොතබයි. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපල පිළිබඳව ණයකරුට පහසුවන්නාවූත් ණය හිමි පිළිගන්නාවූත් කොන්දේසි මත එම දේපල බේරා ගැනීමට උපකාර කිරීම මෙම මණ්ඩලයේ පරමාර්ථයයි. මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර, මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටු කරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් බැවින් ණයබරින් මිරිකී සිටින ජනතාවට මෙමඟින් ලැබී ඇති සේවය අති විශාලය. එසේම තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතිඥයින් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවන බැවින් මහජනතාවට සිදුවන සේවය ඉමහත්ය.

2019 අංක 04 දරණ ණය සහනදායක (සංශෝධිත) පනත අනුව "ණය සහනදායක මණ්ඩලය" අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වන අතර, මණ්ඩලයේ සභාපතිවරයා මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයෙකු ලෙස විනිශ්චයකාර ධූරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තෙකු හෝ, නීතිඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වන්නා වූ වෘත්තීය අත්දැකීම් සහිත තැනැත්තෙකු විය යුතුය.

මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන් දසදෙනා -

- නීතිඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තිය පළපුරුද්ද සහිත හෝ,
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීප ව්‍යාප්ත සේවකයක I වන ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තන් විය යුතුය.
- වාණිජ ක්ෂේත්‍රයේ පලපුරුදු අයෙකු විය යුතුය.
- අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබීය හැකි පරිදි අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් හා හතරදෙනෙකු නොඉක්මවන්නා වූ හා දෙදෙනෙකුට නොඅඩු වන්නා වූ වෙනත් සාමාජීයන් සංඛ්‍යාවකින් සෑම ශාඛා මණ්ඩලයක්ම සමන්විය විය යුතුය.

- සෑම ශාඛා මණ්ඩලයකම සභාපතිවරයා මණ්ඩලයේ සාමාජිකයෙකු විය යුතු අතර, මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස හෝ දිසා අධිකරණ විනිසුරුවරයෙකු ලෙස විනිශ්චයකාර ධූරයක් දරනු ලබන හෝ දරා ඇති තැනැත්තකු හෝ
- නීතිඥවරයෙකු ලෙස අවුරුදු පහළොවකට නොඅඩු වෘත්තිය අත්දැකීම් සහිත තැනැත්තෙකු විය යුතුය.

සෑම ශාඛා මණ්ඩලයකම අනෙකුත් සාමාජිකයන්

- නීතිඥවරයෙකු ලෙස අවුරුදු දහයකට නොඅඩු වෘත්තිය අත්දැකීම් සහිත හෝ,
- ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක I ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරන හෝ දරා ඇති තැනැත්තන්ගෙන් සමන්විත යුතුය.

මෙම මණ්ඩලයේ රාජකාරි කටයුතු සාමාන්‍ය අධිකරණයක පවත්නා ස්වරූපයට වඩා වෙනස් ස්වරූපයක් ගනී. මණ්ඩලය ඉදිරියේ එළඹෙන ගිවිසුම් පාර්ශවකරුවන් ඔවුනොවුන් කැමැත්තෙන් එළඹෙන ගිවිසුම් මිස මණ්ඩලයේ විධාන ක්‍රියාත්මක කිරීමක් නොවේ. එසේ වුවද අසාධාරණ පොළී ප්‍රමාණයන් අඩු කිරීමට ද දෙපාර්ශ්වයේ එකඟතාවය මත ණය ගෙවන කාලය දීර්ඝ කිරීමට ද, මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සාධාරණ යෝජනා ණය හිමියන් විසින් පිළිනොගන්නේ නම් ඒ සම්බන්ධයෙන් ආඥාපනත යටතේ ණයකරුවන්ට සහතිකයක් නිකුත් කිරීමට ද මණ්ඩලයට බලතල ඇත. එසේම ණයහිමි පාර්ශවය අවසාන විභාගය සඳහා නිකුත් කළ නොතීසිය පරිදි විභාගයට නොපැමිණියහොත් ඒකපාර්ශවික නඩු විභාගයකින් අනතුරුව ණයකරු වෙත සහතිකයක් නිකුත් කෙරේ. එහෙත් එසේ කරනු ලබන්නේ ලියාපදිංචි තැපෑලෙන් හා ග්‍රාම නිලධාරි තැන මඟින් අවස්ථානෝචිත පරිදි ණයහිමි වෙත දැනුම් දී ණයහිමි පාර්ශවය හිතාමතාම විභාගයට පැමිණීම පැහැර හරින්නේ යැයි මණ්ඩලයට නිශ්චිත ලෙස ඒත්තු යන අවස්ථාවක දී පමණි. මෙබඳු අවස්ථාවක දී එවැනි සහතිකයක් නිකුත් කිරීමෙන් ඇතිවන වාසිය ණයකරු සතු වේ. වෙනත් අධිකරණයක් මේ පිළිබඳව විභාගයක් පැවත්වෙන අවස්ථාවක දී මෙම සහතිකය එම අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් ණය මුදල බේරුම් කිරීම සඳහා වසර 10 ක උපරිමයකට යටත්ව කාල සීමාවක් ලබාදීමටත් පොළිය අවම අනුපාතය දක්වා අඩුකිරීමටත් නඩු ගාස්තු කිසිවක් ණයකරුගෙන් අයකර නොගැනීමටත් ණය සහනදායක ආඥාපනත යටතේ අධිකරණයට බලතල ලබා දී ඇත.

ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ ණය ගණුදෙනුවලින් පීඩාවට පත්වූ මහජනයාට ණය බරින් නිදහස් වීමට සහනදායි වැඩපිළිවෙළක් සලසාදීම.

මෙහෙවර

උකස්කරයක්, පොරොන්දු සින්නක්කරයක් හෝ හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම සින්නක්කර ඔප්පු සම්බන්ධව ගත් මුදලක් ඇපයට බැඳී ඇති කෘෂිකාර්මික හෝ ගේදොර, ඉඩකඩම් ආදී වූ නිශ්චල දේපලක් ණය සහනදායි අන්දමට වාරික මඟින් හා අඩු පොළී අනුපාතයට ගෙවා නිදහස් කරගැනීමට ණයකරුවන්ට අවශ්‍ය නීතිමය රැකවරණය හා සහන සලස්වා දීම.

අරමුණු

නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස්කර පොරොන්දු සිනක්කරයක් හා හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර හා අනෙකුත් බැඳීම් කෙරෙහි අය විය යුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණවීම.

ප්‍රධාන කාර්යයන්

01. 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත අනුව, ඉඩකඩම්, කුඹුරු, වතුපිටි, නිවාස වැනි නිශ්චල දේපල පොරොන්දු සින්නක්කර ඔප්පු, උකස්කර ඔප්පුවක් මත ඇපයට තබාගත් ණය සම්බන්ධයෙන් හෝ එවැනි ආරක්ෂිත ණයක් සම්බන්ධයෙන් ණය ගැතිවූ මහජනතාවගේ මෙන්ම, 1999 දී කරන ලද අංක 29 දරණ සංශෝධන පනතට අනුව, හුදෙක් ණය ගණුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු සම්බන්ධයෙන් ණය ගැතිවී ඇති මහජනතාවගේ ද පැමිණිලි සම්බන්ධව ණයකරුගෙන් මෙන්ම ණයහිමිගෙන්ද ණය සහනදායක මණ්ඩලය වෙත ලැබෙන පැමිණිලි භාරගැනීමේ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.

02. 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත අනුව පියවර ගැනීම

03. උකස් ඔප්පු පිට හා පොරොන්දු සින්නක්කර ඔප්පු පිට බැඳී ඇති නිශ්චල දේපළ පිළිබඳ ණයකරුට පහසුවන්නාවූත් ණයහිමි පිළිගනු ලබන්නාවූත් කොන්දේසි මත එම දේපළ බේරා ගැනීමට නීතිමය උපකාර කිරීම, සමථකරණ ක්‍රියාවලියට එළඹීම මෙම මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය වේ.

04. මෙම මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන අතර මණ්ඩලයේ කටයුතු මුද්දර ගාස්තුවලින් තොරව ඉටුකරනු ලැබේ. ගැසට් හා නොතීසි ගාස්තු වශයෙන් අයකරනු ලබන්නේ ඉතා සුළු මුදලක් වේ. තමා වෙනුවෙන් මණ්ඩලය ඉදිරියේ නීතීඥයන් ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ.

05. 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත සංශෝධන කටයුතු සිදු කිරීම.

06. පැමිණිලි ලබාගැනීම සඳහා 1941 අංක 39 දරණ ණය සහනදායක ආඥාපනත අනුව පිහිටුවා ඇති ප්‍රධාන ශාඛාව, කොළඹ මණ්ඩලය, ගම්පහ මණ්ඩලය, ගාල්ල මණ්ඩලය සහ කුරුණෑගල මණ්ඩල පවත්වාගෙන යාම.

07. තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා දෙපාර්තමේන්තුව මෙහෙයවීම.

08. දෙපාර්තමේන්තුවට අදාළ සියලුම ආයතනික කටයුතු සිදු කිරීම.

09. දෙපාර්තමේන්තුවට අදාළ ගිණුම් කටයුතු සිදු කිරීම.

10. දෙපාර්තමේන්තුව සම්බන්ධ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කිරීම.

11. දෙපාර්තමේන්තු නිලධාරින්ගේ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම.

12. දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික කාර්ය සාධනය ඉදිරිපත් කිරීම.

1.4 සංවිධාන සටහන


දෙපාර්තමේන්තුවේ ලේකම්
ගණකාධිකාරී
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
සංවර්ධන නිලධාරීන්
කළමනාකරණ සේවා නිලධාරීන්
ලඝු ලේඛක නිලධාරීන්
රියදුරු
කාර්යාල සේවක සේවය

ණය සහනදායක මණ්ඩල සාමාජිකයන්

නම	තනතුර	2019 අංක 4 දරණ ණය සහනදායක (සංශෝධිත) ආඥාපනතෙහි 2 වන උපවගන්තිය අනුව අයත්වන සේවය
ප්‍රධාන ණය සහනදායක මණ්ඩලය		
1. ටී.ජී. සුමිත් අරුණ පෙරේරා මයා	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. කැලුම් කුමාරතුංග මයා	සාමාජික	නීතිඥ
3. එච්.යූ. කාරියවසම් මයා	සාමාජික	විශ්‍රාමලත් ගණකාධිකාරී
4. ඩබ්.පී. සිත්තම්පලම් මයා	සාමාජික	නීතිඥ
5. කේ.එස්. පතිරණ මිය	සාමාජික	නීතිඥ/විශ්‍රාමලත් කම්කරු විනිශ්චය සභා සභාපති
6. සෝමසිරි පල්ලත්තරගේ මයා	සාමාජික	විශ්‍රාමලත් පරිපාලන සේවා නිලධාරී
7. ඩබ්.එන්. ප්‍රියදර්ශනී හේරත් මිය	සාමාජික	නීතිඥ/විශ්‍රාමලත් කම්කරු විනිශ්චය සභා සභාපති
කොළඹ ණය සහනදායක මණ්ඩලය		
1. ජී.එම්.ඩබ්. ප්‍රදීප් ජයතිලක මයා	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. එන්.පී.කේ. ලොකුගේ මිය	සාමාජික	නීතිඥ
3. ඉන්ද්‍රා බඳුගේ මිය	සාමාජික	නීතිඥ
ගම්පහ ණය සහනදායක මණ්ඩලය		
1. එන්.එස්. හපුආරච්චි මයා	සභාපති	විශ්‍රාමලත් සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරු
2. සී.ඩබ්. සෙනෙවිරත්න මිය	සාමාජික	විශ්‍රාමලත් මහේස්ත්‍රාත් /දිසා විනිසුරු
3. ඩී.ජේ. රුවන් පතිරණ මයා	සාමාජික	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
ගාල්ල ණය සහනදායක මණ්ඩලය		
1. ද එස්.එම්.ඩී.එස්. දයාරත්න මිය	සභාපති	නීතිඥ
2. කේ.පී.ඩී. ගුණරත්න මයා	සාමාජික	නීතිඥ
3. ජානි නානායක්කාර මිය	සාමාජික	නීතිඥ
කුරුණෑගල ණය සහනදායක මණ්ඩලය		
1. ආර්.එම්.පී.එස්.කේ. රත්නායක මයා	සභාපති	විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු
2. ජේ.ජී.එන්. තිලකරත්න මයා	සාමාජික	විශ්‍රාමලත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
3. එස්.ඩී. සෙනෙවිරත්න මයා	සාමාජික	නීතිඥ

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2025.01.01 සිට 2025.12.31 දක්වා ණය සහනදායක මණ්ඩලයේ කාර්ය සාධනය

විස්තරය	සංඛ්‍යාව
2025.01.01 දිනට ඉදිරියට ගෙනා නොනිමි ඉල්ලුම්පත් සංඛ්‍යාව	959
වර්ෂය තුළ ලැබුණු නව ඉල්ලුම්පත් සංඛ්‍යාව	677
සමාලෝචනය සඳහා හා නිෂ්ප්‍රභා ඉල්ලීම් සඳහා ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව	295
ප්‍රධාන ශාඛාව වෙත සහ ශාඛා මණ්ඩල වෙත ලද අයදුම්පත් සංඛ්‍යාව	04
මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව	1935
සමථයට පත්කල ඉල්ලුම්පත් සංඛ්‍යාව	334
නිෂ්ප්‍රභා කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	163
සමාලෝචනය කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	63
සහතික නිකුත් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව	48
ඉල්ලා අස්කරගත් ඉල්ලුම්පත් සංඛ්‍යාව	56
රෝලෙන් ඉවත් කරන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	80
පසෙක තබන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	06
ශාඛා මණ්ඩල වෙත යවන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව	07
අවසන් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව	366
පියවර ගත් මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව	1123
ඉතිරි අයදුම්පත් සංඛ්‍යාව	812
මුදල් ගෙවීම සඳහා නැවත කැඳවන අයදුම්පත් සංඛ්‍යාව	272
2025.12.31 දිනට අවසන් නොවී ඉතිරි වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව	**1084**

- 2025 වර්ෂයේදී අවසන් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව මුළු අයදුම්පත් සංඛ්‍යාවෙන් 59% ක ප්‍රතිශතයකි.

<u>දිස්ත්‍රික් වශයෙන් ලද අයදුම්පත් සංඛ්‍යාව</u>

2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා

ශාඛා	**දිස්ත්‍රික්කය**	**2025.12.31 දිනට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව**
ප්‍රධාන/කොළඹ	කොළඹ	**107**
	කළුතර	**66**
	රත්නපුර	**28**
	බදුල්ල	**04**
	මොණරාගල	**03**
ගම්පහ	ගම්පහ	**144**
ගාල්ල	ගාල්ල	**79**
	මාතර	**42**
	හම්බන්තොට	**15**
කුරුණෑගල	කුරුණෑගල	**107**
	කෑගල්ල	**37**
	මහනුවර	**23**
	ත්‍රිකුණාමලය	**01**
	පුත්තලම	**10**
	මාතලේ	**09**
	අනුරාධපුරය	**02**
	එකතුව	**677**

2025.01.01 සිට 2025.12.31 දක්වා ණය සහන ශාඛා මණ්ඩලවල කාර්යසාධනය

ශාඛා මණ්ඩලය	2025.012.31 දිනට ශාඛා සතුව පවතින නඩු සංඛ්‍යාව 1	ශාඛාවලින් ලද/ නිශ්ප්‍රභා සහ සමාලෝචන නැවත ඉල්ලීම් සංඛ්‍යාව 2	වර්ෂය තුල ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව 3	1 + 2 + 3	2025.12.31 දිනට අවසන් කරන ලද නඩු සංඛ්‍යාව	2025.12.31 දිනට ඉතිරි වී ඇති නඩු සංඛ්‍යාව A	2025.12.31 දිනට සමථ වී මුදල් ගෙවීම සඳහා නැවත කැඳවන නඩු සංඛ්‍යාව B	2025.12.31 දිනට ඉතිරි වී ඇති නඩු සංඛ්‍යාව A+B	2025.12.31 දිනට අවසන් නඩු සංඛ්‍යාව %
ප්‍රධාන ශාඛාව	146	16	116	278	180	98	86	184	64%
කොළඹ ශාඛාව	140	16	94	250	145	105	36	141	58%
ගම්පහ ශාඛාව	377	36	144	557	278	279	111	390	49%
කුරුණෑගල ශාඛාව	186	93	187	466	277	189	12	201	59%
ගාල්ල ශාඛාව	110	138	136	384	243	141	27	168	63%
එකතුව	**959**	**299**	**677**	**1935**	**1123**	**812**	**272**	**1084**	**59%**

මූල්‍ය ප්‍රගතිය

වැය විෂය	2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු මි.)	2025.12.31 දිනට වියදම (රු මි.)	2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (%)
ප්‍රාග්ධන වියදම	5.15	4.1	79.66 %
පුනරාවර්තන	100.05	73.82	73.78 %
එකතුව	105.2	77.92	74.07 %

දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම

ණය සහනදායක මණ්ඩල මේ වන විට කොළඹ 08, ආචාර්ය එන්. එම්. පෙරේරා මාවතෙහි අංක 35 ඒ, දරණ ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන අතර දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම පාහේ ණයසහනදායක මණ්ඩලයේ සහනපතා දෛනිකව කොළඹට පැමිණෙන මහජනතාවගේ පහසුව සඳහා දෛනිකව ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන්, මහජනතාව වෙත කාර්යක්ෂමව සේවාව සැපයීම සඳහාත්/ ණය සහනදායක මණ්ඩලයේ සේවාව දීපව්‍යාප්ත කිරීමේ අරමුණින් 2019 අංක 04 දරණ ණය සහනදායක (සංශෝධිත) පනත අනුව ශ්‍රී ලංකා ණය සහනදායක මණ්ඩලය ලෙස පුළුල් කරන ලදි.

ඒ අනුව, ණය සහනදායක මණ්ඩලය සඳහා දෛනිකව ලැබෙන අයදුම්පත් අනුව වැඩි වශයෙන් අයදුම්පත් ඉදිරිපත් වන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගනිමින් ගාල්ල , කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ශාඛා මණ්ඩල පිහිටුවා ඇත. තවද උතුර, උතුරු මැද, වයඹ සහ මධ්‍යම පළාත් ද ආවරණය වන ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ශාඛා මණ්ඩලයක් ද පිහිටුවා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ණය සහනදායක මණ්ඩලයේ සේවාව ඉතා කාර්යක්ෂම සහ ඵලදායී අයුරින් මහජනතාව වෙත ලබාදීමට බලාපොරොත්තු වෙමු. 2027 වසරේ දී මධ්‍යම පළාත තුළ මහනුවර දිස්ත්‍රික්කය තුළ, ප්‍රතිපාදන ලැබෙන පරිදි, නව ශාඛාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවන අතර, එම නව ශාඛාව ඇරඹීම අරමුණු කරගෙන රාජ්‍ය නිලධාරීන් සහ මහජනතාව අතර ණය සහනදායක මණ්ඩලයේ කාර්යභාරය පිළිබඳ දැනුවත්භාවය ඇතිකිරීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා ජනමාධ්‍ය මෙන්ම, දැනුවත් කිරීමේ වැඩසටහන් මගින්ද, සිංහල, දමිල මාධ්‍ය භාවිතයෙන් ද දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එසේම දුර ප්‍රදේශවල සහ විදේශගත අයදුම්කරුවන්ගේ නඩු කටයුතු ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් සිදුකිරීමට ද, 2026 වසරේ දී පියවර ගනු ලැබේ.

රාජ්‍ය ගිණුම් කාරක සභාවේ යෝජනාව පරිදි ඉදිරියේ දී ප්‍රතිපාදන ලැබෙන අයුරින් අනෙකුත් පළාත් ආවරණය වන පරිදි ශාඛා මණ්ඩල පිහිටුවීමට සැලසුම් සකස් කරමින් පවතී. එමෙන්ම සේවය වඩා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා ධාරිතා සංවර්ධනය හා කාර්යාල උපකරණ මිල දී ගැනීම සඳහා කටයුතු කරමින් පවතී.

සුභාෂිණී දයානන්ද

ලේකම්

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

03. පරිච්ඡේදය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය.

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	සත්‍ය 2025 රු.	සත්‍ය 2024 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		78,657,000	67,757,000	ඒසීඒ-3
-	තැන්පතු		144,386	300,873	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		1,742,963	1,203,210	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**80,544,349**	**69,261,083**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**80,544,349**	**69,261,083**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		**517**	**644,075**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**80,543,832**	**68,617,008**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ-2(ii)
67,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	46,393,813	39,874,644	ඒසීඒ-2(ii)
32,950,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	27,398,374	26,565,899	ඒසීඒ-2(ii)
100,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	27,134	28,640	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ඒසීඒ-2(ii)
100,050,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**73,819,321**	**66,469,183**	
	මූලධන වියදම්				
1,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	224,010	867,000	ඒසීඒ-2(ii)
3,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	3,231,755	1,486,116	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
650,000	හැකියා වර්ධනය	14	646,500	264,500	ඒසීඒ-2(ii)
-	වෙනත් මූලධන වියදම්	15	-	-	ඒසීඒ-2(ii)
5,150,000	**මුළු මූලධන වියදම් (උ)**		**4,102,265**	**2,617,616**	

1

	කැන්පතු ගෙවීම	227,347	223,187	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම	5,682,635	1,471,536	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම	-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)	**5,909,982**	**1,694,723**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)	**83,831,568**	**70,781,522**	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)	**(3,287,736)**	**(2,164,514)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය	(3,287,736)	(2,213,661)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		49,147	ඒසීඒ-3
		(0)	-	

ඩී.ඒ.ඒ. සඳමාලි
ගණකාධිකාරී (වැ.බ)
ණය සහනදායක මණ්ඩලයිය දෙපාර්තමේන්තුව
අංක: 35 ඒ, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

ඒසීඒ-ඕ

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	17,336,656	13,202,235
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	6,696,901	2,757,229
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	49,147
මුළු වත්කම්		24,033,557	16,008,611
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		6,696,901	2,674,268
දේපළ පිරියත හා උපකරණ සංචිතය		17,336,656	13,202,235
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	82,961
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	49,147
මුළු වගකීම්		24,033,557	16,008,611

පිටු අංක 09 සිට 29 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 35 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ජනාධිපති නීතිඥ,අයේෂා ජිනසේන
තනතුර : ලේකම්, අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
දිනය : 2026.02.25

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

D. S. Dayananda.
....
ගණන්දීමේ නිලධාරි
නම : සුභාෂිණී දයානන්ද
තනතුර :ලේකම්, ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
දිනය : 2026.02.24

සුභාෂිණී දයානන්ද
ලේකම්
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
අංක: 35 ඒ, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ඩී. ඒ.ඒ. සඳමාලි
දිනය : 2026.02.24

ඩී.ඒ.ඒ. සඳමාලි
ගණකාධිකාරි (වැ.බ)
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව
අංක: 35 ඒ, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

3

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තතය 2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	2,900,907	1,913,975
අග්‍රිම ලැබීම්	78,657,000	67,757,000
අත්තිකාරම් අයකර ගැනීම්	2,020,248	1,459,746
තැන්පතු ලැබීම්	144,386	300,873
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**83,722,541**	**71,431,594**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	73,626,300	66,397,393
සහනාධාර සහ මාරුකිරීම්	27,134	28,640
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම , මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	870,510	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	105,489	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	517	644,075
අත්තිකාරම් ගෙවීම්	5,682,635	1,471,536
තැන්පතු ගෙවීම්	227,347	223,187
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**80,539,932**	**68,764,831**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**3,182,608**	**2,666,763**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිම්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-

4

3.2 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් සංකේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොලිය - අනෙකුත්	125,000	125,000	189,440.23	151.55%
20.03.99.00	විකුණුම් සහ ගාස්තු අනෙකුත් ලැබීම්	950,000	950,000	1,120,375	117.93%
20.04.01.00	වෙනත්	1,440,000	1,440,000	1,591,091.53	110.49%

3.3 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මූල්‍ය ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	100,200,000	100,050,000	73,819,320.52	73.78%
ප්‍රාග්ධන	5,000,000	5,150,000	4,102,265.29	79.66%

3.4 මු.රෙ 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ම ප්‍රධානය කරන ලද ප්‍රධාන ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන	තත්‍ය වියදම	උපයෝගි කරගන්නා ලද ප්‍රතිපාදන ලබා අවසාන ප්‍රතිපාදනවල % ලෙස
අදාල නොවේ					

3.5 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම්	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දි ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9152	යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ	17,336,656.04	17,336,656.04	-	100%

3.6 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	JLO/A/DDCB/FA/2025/05	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2026 මැයි 29 දින

ලේකම්
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණින් වන බලපෑම හැර, ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කළින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා

දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයට අයත්ව තිබුණු එකතුව රු.7,000,000ක් වටිනා මෝටර් රථ 02 මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකය අනුව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණ ද, එම මෝටර් රථ දෙක තක්සේරුකර මූල්‍ය නොවන වත්කම් තුල දක්වා නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයන් 13ක හා එක් ප්‍රාග්ධන වැය විෂයක ප්‍රතිපාදිත රු.65,950,000කින් රු.26,353,770ක් ඉතිරි වී තිබුණු අතර, එය සියයට 13 සිට සියයට 100ක පරාසයක් ගෙන තිබුණි.

(ආ) අතිකාල හා නිවාඩුදින වැටුප් වැය විෂයෙහි රු.504,289ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 50ක ඉතිරිවීම් සඳහා අයවැය චක්‍රලේඛ 01/2025 හා 01/2024 ප්‍රකාරව රජයේ වියදම් කළමනාකරණය කිරීම හේතුවෙන් අතිකාල හා නිවාඩු දින වැටුප් ප්‍රතිපාදන

ඉතිරි වී ඇති බව හේතු ලෙස දක්වා තිබුණ ද, ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 ප්‍රකාරව අවශ්‍යතාවය හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙලකර නොතිබුණි.

(ඇ) වෙනත් දීමනා වැය විෂයෙහි රු.19,648,703ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 43ක ඉතිරිවීම් සඳහා නව ශාඛා කාර්යාල පිහිටුවීම සඳහා ලද අමතර ප්‍රතිපාදන සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව මාසික දීමනාව නව වැටුප් පරිමාණයන් තුළ අන්තර්ගත කිරීම මත ඉතිරිවීම් ලෙස හේතු දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට නව ශාඛා කාර්යාල ස්ථාපිත කිරීම ඇතුළත්කර නොතිබුණි.

(ඈ) ප්‍රවාහන වියදම් වැය විෂයෙහි රු.200,000ක් එනම් සම්පූර්ණ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර, ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරීන් නොමැති වීම ලෙස එයට හේතු දක්වා තිබුණි. දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යමණ්ඩලය තුළ ප්‍රවාහන දීමනාවට හිමිකම් සහිත එක් තනතුරක් පමණක් පවතින අතර, එම තනතුර වෙනුවෙන් වාහනයක් වෙන් කර තිබුණි. තව ද, 2024 වර්ෂයේ ද සම්පූර්ණ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර, එයට හේතු ලෙස ඉහත හේතුවම දක්වා තිබුණි.

(ඉ) යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා හා විවිධ සේවා යන වැය විෂයයන්හි පිළිවෙලින් රු.851,884ක් හා රු.983,924ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 71ක හා සියයට 49ක ඉතිරිවීම් සඳහා වියදම් කළමනාකරණය හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් ලෙස හේතු දක්වා තිබුණ ද, අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

(ඊ) රජයේ සේවක දේපල ණය පොලි වැය විෂයෙහි රු.72,866ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 73ක ඉතිරිවීම් සඳහා දේපළ ණය ලබාගත් නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ අවමවීම ලෙස හේතු දක්වා තිබුණ ද, 2023 හා 2024 වර්ෂවල ද, මෙම වැය විෂයෙහි ඉතිරිවීම්වල හේතුව ලෙස ඉහත කරුණම දක්වා තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය නිවැරදිව හඳුනානොගෙන ඇස්තමේන්තු පිළියෙලකර තිබුණි.

3.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880, 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇපආඥා පනතට හා 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන අධිකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය	ඇප තැබිය යුතු නිලධාරීන් 11දෙනෙකු ඇප තබා නොතිබුණි.
(ආ)	2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.10 ඡේදය	මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී ඉකුත් වර්ෂ සඳහා සංසන්දනාත්මක දත්ත එම මාර්ගෝපදේශයේ 7.8 හා 7.9 ඡේද ප්‍රකාරව ඉදිරිපත්කළ යුතු වුව ද, එසේ ඉදිරිපත්කර නොතිබුණි.

(ඇ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
	(i) 1.5 වගන්තිය	රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන් සහභාගී වන ඕනෑම රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවක් සම්බන්ධයෙන් තමන්ගේ බැඳියාවන් පිළිබඳ සටහනක් නොමැති බවට ප්‍රකාශයක් ඉදිරිපත්කළ යුතු වුවත්, එසේ ඉදිරිපත්කර නොතිබුණි.
	(ii) 2.5 වගන්තිය	දෙපාර්තමේන්තුව සඳහා ඩෙක්ස්ටොප් පරිගණක යන්ත්‍ර 05ක් Office Network (pvt) Ltd වෙතින් රු.1,345,200 වටිනාකමකට ද, UPS යන්ත්‍ර 05ක් රු.40,060කට ද, මිලදීගැනීමේ ප්‍රසම්පාදනය සඳහා භාරගැනීමේ කමිටුවක් පත්කර නොතිබුණි.
	(iii) 8.7 වගන්තිය	වටිනාකම රු.1,000,000 ඉක්මවනු ලබන ඕනෑම වැඩ/සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹිය යුතු වුව ද, පෞද්ගලික ආයතනය සමඟ ගිවිසුමකට එළැඹ නොතිබුණි.
(ඈ)	2011 ජනවාරි 21 දිනැති අංක 1689/18 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය	සභාපති සහ මණ්ඩලයේ හෝ ශාඛා මණ්ඩලයේ සෑම සාමාජිකයෙක්ම තම නිවසින් බැහැරව නිල කාර්යයක යෙදී සිටින විට ඔහුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි 12 වැනි වගන්තිය ප්‍රකාරව රු.500ක ඒකාබද්ධ දීමනාවක් ගෙවිය යුතු ලෙස සඳහන් වුව ද, චක්‍රලේඛය පරිදි සංයුක්ත දීමනා ගෙවීමේ දී ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව මණ්ඩලයේ සාමාජිකයන් පැමිණීමේ සහ පිටවීමේ වේලාව සටහන් නොකරන බැවින්, කොපමණ කාලයක් කාර්යයේ නිරත වූවා ද යන්නඅ තහවුරුකර ගැනීමකින් තොරව රු.1,807,000ක මුදලක් ඒකාබද්ධ දීමනා ලෙස ගෙවීම්කර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට විසඳීමට තිබුණු තථ්‍ය අයදුම්පත් සංඛ්‍යාව 1,084ක් වූ අතර, එය වර්ෂය තුළ විසඳීමට තිබුණු 1,935ක් වූ මුළු අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 56ක අගයක් ගෙන තිබුණි. මේ තුළ ප්‍රධාන මණ්ඩලයේ අයදුම්පත් 184ක් ද, කොළඹ ශාඛාවේ අයදුම්පත් 141ක් ද, ගම්පහ ශාඛාවේ අයදුම්පත් 390ක් ද, කුරුණෑගල සහ ගාල්ල ශාඛාවල අයදුම්පත් සංඛ්‍යාව පිළිවෙලින් 201ක් හා 168ක් ලෙස ඉතිරි වී තිබුණි. ඒ අනුව වර්ෂය තුළ ශාඛාවල විසඳීමට තිබුණු අයදුම්පත් සංඛ්‍යාව හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂය අවසාන දිනට නොවිසඳන ලද වැඩිම අයදුම්පත් සංඛ්‍යාවක් ගම්පහ ශාඛාවේ වූ අතර එම ශාඛාවේ නඩු විසඳීමේ ප්‍රතිශතය සියයට 49කි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට විභාග වන අයදුම්පත් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද කාලවිශ්ලේෂණය අනුව අවුරුදු 03ත් 05ත් අතර, විභාග වන

අයදුම්පත් සංඛ්‍යාව 76ක් ද, අවුරුදු 05ත් 10ත් අතර, විභාග වන අයදුම්පත් සංඛ්‍යාව 89ක් හා අවුරුදු 10ට වැඩි විභාග වන අයදුම්පත් සංඛ්‍යාව 17ක් ලෙස පැවතුණි. ඒ අනුව වසර 03ට වැඩි කාලයක සිට නොවිසඳා තිබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව 182ක් වූ අතර, එය සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට විසඳීමට තිබූ 1,084ක් වූ අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 17ක අගයක් ගෙන තිබුණි.

(ඇ) කොළඹ ශාඛා මණ්ඩලය මගින් ආවරණය කරනු ලබන අධිකරණ සීමා බලප්‍රදේශ 06න් 04 ක්ම එනම් රත්නපුර, ඇඹිලිපිටිය, නුවරඑළිය හා මොණරාගල අධිකරණ සීමා බලප්‍රදේශ කොළඹින් බොහෝ දුර බැහැරව පවතින බැවින්, ණය නිරවුල්කර දෙන ලෙසට වූ ඉල්ලීම් ලැබීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවති අතර, බදුල්ල හා මොණරාගල අධිකරණ බල ප්‍රදේශවලින් සමාලෝචිත වර්ෂය තුළ අයදුම්පත් 07ක් පමණක් ලැබී තිබුණි.

4.2 කළමනාකරණ දුර්වලතා

(අ) ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව විසින් ජනතාවට සපයන සේවාවන් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 12ක් වර්ෂය තුළ ක්‍රියාත්මකකර තිබුණු අතර, ඉන් වැඩසටහන් 08ක් සඳහා රු.527,392ක මුදලක් දරා තිබුණ ද, එය සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික්ක 09කින් වර්ෂය තුළ අයදුම්පත් කිසිවක් ලැබී නොතිබුණු අතර, උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක 05 ද මේ තුළ ඇතුළත් වී තිබුණි. තව ද, වර්ෂය තුළ රු.175,200ක වියදමක් දරා දෙමළ මාධ්‍යයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

කේ.කේ.එස්. ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 වන පරිච්ඡේදය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුම් ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
කාර්ය මණ්ඩල අභිප්‍රේරණය	90 %	-	-
දෙපාර්තමේන්තුවේ සේවාව සැපයීම හා ලබන ප්‍රචාරණය	90 %	-	-
දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවයෙහි ඵලදායිතාවය	-	-	70%

05 වන පරිච්ඡේදය

තිරසාර සංවර්ධනය අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0% - 49%	50% -74%	75% - 100%
නිශ්චල දේපල සම්බන්ධයෙන් වූ උකස්කර පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගණුදෙනු සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු හා අනෙකුත් බැඳීම් කෙරෙහි වූ අයවිය යුතු ණය සම්මුති වලට පාර්ශවයන් පැමිණවීම	ණය සහනදායක මණ්ඩලය විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාව පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම	ණය සහනදායක මණ්ඩලයේ ශාඛා ගම්පහ, කුරුණෑගල හා ගාල්ල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් පිහිටුවීම හා කොළඹ දිස්ත්‍රික්කයේද නව ශාඛා මණ්ඩලයක් පිහිටුවීම. මෙමගින් විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රම සඳහා වැඩි ජනතාවක් යොමු කරවීම.			85%

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ණය සහනදායක මණ්ඩලයේ ශාඛා මණ්ඩල ගම්පහ, ගාල්ල, කුරුණෑගල සහ කොළඹ යන දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් පිහිටුවා පවත්වාගෙන යනු ලැබේ. මෙමගින් විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රම යොදාගනිමින් අධිකරණය වෙත පැමිණිලි නොකර තම ප්‍රශ්ණ විසඳා ගැනීමේ අවස්ථාව (SDG 16-3) ජනතාව වෙත ලැබී ඇති අතර ප්‍රධාන මණ්ඩලය පමණක් තිබිය දී ලද අයදුම්පත් සංඛ්‍යාවට වඩා ශාඛා පිහිටුවීමෙන් පසු අයදුම්පත් ලැබෙන ප්‍රමාණය අවුරුද්දකට 50% කින් පමණ වැඩි වී ඇත. එසේම ණය සහනදායක මණ්ඩල වෙත ලැබෙන පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය ද 25% කින් පමණ වැඩි වී ඇත.

06 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු (අතිරික්ත)
ජ්‍යෝෂ්ඨ	02	01 01 (වැ.බ.)	01
තෘතියික	නැත	නැත	නැත
ද්විතියික	39	24 (02 අනුයුක්ත)	11
ප්‍රාථමික	09	08	01

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දෙපාර්තමේන්තුවේ සේවාව කාර්යක්ෂමව හා ඵලදායිව මහජනතාව වෙත ලබා දීමට දෙපාර්තමේන්තුව තුළ පවතින සේවක පුරප්පාඩු බෙහෙවින් බලපෑම් සිදුකරනු ලබයි.

මේ තුළ දීර්ඝ කාලයක සිට පැවැති ලසු ලේඛක පුරප්පාඩු 2024 වසර තුළ සම්පූර්ණ කරන ලද අතර ලසු ලේඛිකාවන් 6 දෙනෙකු සේවයට බඳවා ගන්නා ලදී.

දෙපාර්තමේන්තුව තුළ පවතින විෂයන් ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැතිවීම හේතුවෙන් එක් නිලධාරියෙකුහට විෂයන් කිහිපයක් ආවරණය කිරීමට සිදුවිය. එහෙයින් දෙපාර්තමේන්තුවේ සේවය කාර්යක්ෂමව සැපයීමට බාධා සිදු විය. මේවන විට ගණකාධිකාරී සේවයේ එක් නිලධාරියෙකු, කළමනාකරණ සේවා නිලධාරීන් 09ක් හා සංවර්ධන නිලධාරී 2ක අඩුවක් පවතී. අනුමත සේවක සංඛ්‍යාව 50 ක් වුවද කාර්යක්ෂම සේවයක් පවත්වාගෙනයාම සඳහා ශාඛා කාර්යාල සඳහා ලසු ලේඛක තනතුරු 2ක් හා කාර්යාල කාර්ය සේවයේ තනතුරු 2 බැගින් පැවතීම අත්‍යවශ්‍යව පවතී. මණ්ඩලවල “නඩු සටහන්” නියමිත වේලාවට නොලැබීම නඩු කල්යාමට හේතුවක් වේ. නඩුවල සටහන් නියමිත වේලාවට ලබාදීම සඳහා ශාඛාවකට ලසුලේඛක තනතුරු 2ක් අවශ්‍යව ඇත. ඒ අනුව කළමනාකරණ සේවයේ තනතුරු 3ක් යටපත් කර, ඒ වෙනුවට ලසු ලේඛක තනතුරු 3ක් ලබාදෙන මෙන් ඉල්ලීම් කර ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (දේශීය) රු.	වැඩසටහනේ ස්භාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව	01	වසර 01	**225,000/-**	දේශීය	ආයතනය කළමනාකරණය පිළිබඳ දැනුවත්භාවය
වැටුප් පරිවර්තන පුහුණු වැඩසටහන	**02**	දින 02	**26,000/-**	දේශීය	වැටුප් පරිවර්තන කාර්ය පිළිබඳ දැනුවත්භාවය
නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ	**01**	දින 02	**13,000/-**	දේශීය	ප්‍රසම්පාදන කාර්යන් පිළිබඳ දැනුවත්භාවය
පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	**01**	දින 02	**18,000/-**	දේශීය	පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ දැනුවත්භාවය
Office File management	**01**	දින 02	**15,000/-**	දේශීය	කාර්යාල ගොනු සම්බන්ධ දැනුවත්භාවය
පොත් බැඳුම්කරණය සහ නිමාව	**01**	මාස 07	**40,500/-**	දේශීය	පොත් බැඳුම්කරණය සම්බන්ධ දැනුවත්භාවය
Government Payroll system	**01**	දින 01	**18,000/-**	දේශීය	වැටුප් සැකසීම පිළිබඳ දැනුවත්භාවය
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම්	**01**	දින 02	**13,000/-**	දේශීය	නිවාඩු විෂය සම්බන්ධ දැනුවත්භාවය
ආයතන සංග්‍රහය පිළිබඳ දෙදින වැඩමුළුව	**01**	දින 02	**13,000/-**	දේශීය	කාර්යාල කටයුතු දැනුවත්භාවය
Advance MS Excell	**06**	දින 02	**78,000/-**	දේශීය	MS Excell පිළිබඳ දැනුවත්භාවය
Stores Management, Inventory Handling, Annual stock verification & disposal procedures	**01**	දින 02	**13,000/-**	දේශීය	ගබඩා කටයුතු දැනුවත්භාවය
රැඳවීමේ අපහරණ රෙගුලාසි සකස් කිරීම. ලේඛන කාමරය පවත්වාගෙන යාම	**02**	දින 01	නොමිලේ	දේශීය	ලේඛනාගාරය විධිමත්ව පවත්වාගෙනයාම පිළිබඳ දැනුවත්භාවය
රා.ප.ච 18/2020 අනුව දෙමළ භාෂා පාඨමාලාව	**03**	මාස 03	නොමිලේ	දේශීය	භාෂාව දැනුවත්භාවය
පෞද්ගලික ලිපිගොණු කළමනාකරණය	**02**	දින 02	**26,000/-**	දේශීය	පෞද්ගලික ලිපිගොනු දැනුවත්භාවය
ප්‍රසම්පාදන සැලසුම් වැඩසටහන	**01**	දින 01	**14,000/-**	දේශීය	ප්‍රසම්පාදන කටයුතු දැනුවත්භාවය
භාණ්ඩ සමීක්ෂණ වැඩසටහන	**04**	දින 01	**50,000/-**	දේශීය	භාණ්ඩ සමීක්ෂණ දැනුවත්භාවය
Advance certificate in public procurement	**01**	මාස 05	**30,000/-**	දේශීය	ප්‍රසම්පාදන කටයුතු දැනුවත්භාවය
ගිණුම්කරණ ක්‍රියාවලියට අදාළ පොත්පත් හා ලේඛන භාවිතය	**02**	දින 02	**26,000/-**	දේශීය	ගිණුම්කරණ ක්‍රියාවලිය දැනුවත්භාවය
Bid evaluation	**02**	දින 01	**28,000/-**	දේශීය	ලංසු කැඳවීමේ කටයුතු දැනුවත්භාවය
			646,500/-		

ඒ ඒ විෂය පථයන්ට අදාළව දැනුම හා කුසලතා වර්ධනය කිරීමට උපකාරී වන පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම මගින් ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතුව නිවැරදිව විෂය කටයුතු කරගෙන යාමට හැකිවීම තුළින් ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා උපකාරී වේ. පුහුණු වැඩසටහන් සඳහා ලබා දී තිබුණු ප්‍රතිපාදන වලින් 100% වැයකර ඇත.

07 වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වාගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරකම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)		අදාළ නොවේ.	
1.4	ගබඩා අත්තිකාරම්		අදාළ නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.6	වෙනත්		අදාළ නොවේ	
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම		මෙම දෙපාර්මේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත. අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කරනු ලබයි.	
2.5;	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA- N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදි ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලැසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරිම		මෙම දෙපාර්මේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැත. අභ්‍යන්තර විගණන කටයුතු අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කරනු ලබයි.	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහන ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුමවලට පිළිතුරු දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134 (2) DMA/1 2019 අනුව වසර ආරම්භයේ දි විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අධිකරණ අමාත්‍යංශය මගින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.		මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අධිකරණ අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු කරනු ලබයි.	
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිකරවරයාට ඉදිරිපත් කිරීම.		මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොමැති අතර අධිකරණ අමාත්‍යංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි.	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ.		

	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණ සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා සකස්කොට නියමිත විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදි අපහරණය කර තිබීම		අදාළ නොවේ	
9.3	වාහන ලොග් පොත පවත්වාගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රෙ 103, 104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම, නැවත පරික්ෂා කිරීම.	අනුකූල වේ		

9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්යෙන්ම අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ 94 (1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වල පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණය සිදු කර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		

14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවතාවගෙ යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලාධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/ 2008 හා 05/ 2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අනුව පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සම්පාදනය**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ.		